**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2019**

-------------------------------------------------------

## 1.1 මතය

------

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

-------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙනයාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම

නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍යවේ.

## 1.6 නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළද පාලක සභාවේ අනුමැතියට ඉදිරිපත් කළ නොහැකි වූ බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 31 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා පීඊඩී/12 චක්‍රලේඛයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සඳහා සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අයවැය වාර්තාව සඳහා 2019 සැප්තැම්බර් 30 දින අනුමැතිය ලබාගත් බව. | 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර අයවැය ලේඛනය වර්ෂය ආරම්භවීමට පෙර අනුමත කර ගත යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මාසික කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. මිලියන 1.2 ක් පමණ වුවත්, සභාවේ ජංගම ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට රු. 62,878,499 ක ශේෂයක් පැවතුණු අතර අතිරික්ත මුදල් ඵලදායී කාර්යයක් සඳහා යොදවා නොතිබුණි. | 2020 පෙබරවාරි 20 දින රු. මිලියන 44 ක් ස්ථාවර තැන්පත්වල යෙද වූ බව. | අතිරික්ත මුදල් ඵලදායී කාර්යයක් සඳහා යෙදවීමට කළමනාකරණය වගබලා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 59,465,917 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 59,487,764 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,847 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී හඳුනානොගත් වාහන අනතුරුවලින් සිදු වූ මරණ හා බරපතල අනතුරු වෙනුවෙන් රු. 7,400,000 ක මුදලක් වන්දි ගෙවා තිබූ අතර මෙම ගෙවීම මාස 10 සිට මාස 36 ක කාල පරාසයක ප්‍රමාදයකින් යුක්තව ගෙවා තිබුණි. හඳුනානොගත් වාහනවලින් අනතුරට පත් වූ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයේ උපදෙස් පත්‍රිකාව අනුව අවම වශයෙන් මාස 09 ක කාලසීමාව ඇතුලත සිදුකල යුතු වුවත්, අයදුම්පත් 09 ක් සඳහා වන්දි ගෙවීම මාස 10 සිට මාස 26 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය. | හප්පා පලායාමක් ලෙස තහවුරු කරගැනීම තීන්දු කරන පොලිස් වාර්තාව ලබාදීමට පොලීසිය මාස 06 ක පමණ කාලයක් ලබාගන්නා බව. | ප්‍රමාදය මාස 10 සිට මාස 36 දක්වා පරාසයක පවතින බැවින් ප්‍රමාදය අවම වන ලෙස කටයුතු කළ යුතු බව. |
| (ආ) | රක්ෂණ ආයතන සියළුම රක්ෂණ ඔප්පුවලින් සියයට 02 ක මුදලක් ගෙවීමට එකඟ වී ඇතත් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | තෙවන පාර්ශවයේ රක්ෂනවලින් සියයට 02 ක් ලබාදීමට එකඟ වූ බවත් එකඟතාවය ලිඛිතව ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | කඩිනමින් එම කාර්යය නිම කිරීමට කටයුතු කළ යුතු බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවද අත්සන්කරුවකු වන මාර්ග ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනා සම්මතයට අනුව රජය විසින් ඉටුකළ යුතු කාර්යයක් ලෙස මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් | ජාතික සභාව කොමිෂමක් බවට පත්කිරීමේ කටයුතු තවමත් නිම වී නැති බැවින් මෙම කාර්යය | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම ජාතික අවශ්‍යතාවයක් වන |

| | | | |
|---|---|---|---|
| | සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | ඉටුකර ගත නොහැකි වූ බව. | බැවින් මේ සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු බව. |
| **(ආ)** | 2019 ක්‍රියාකාරී සැලැස්මේ මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති 10 ක් හා එය ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරකම් 30 ක් දක්වා තිබුණු අතර ඉන් සියයට 100 ක් ඉටු කර තිබුණේ ව්‍යාපෘති 03 කට අදාළ ක්‍රියාකාරකම් 11 ක් පමණි. ඉතිරි ව්‍යාපෘති 07 ඉටුකර ගැනීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කෙරේ. | පාලක මණ්ඩලය පත් කිරීමට ප්‍රමාදවීම, පාස්කු ප්‍රහාරය, මැතිවරණයට දින නියම කිරීම ආදී හේතූන් නිසා ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි වූ බව. | සැලැසුම් කළ පරිදි සභාවේ කාර්යසාධනය උපරිම මට්ටමෙන් පවත්වාගෙන යාමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව සභාව උපයාගත යුතු ආදායම රු. මිලියන 73 ක් වූ අතර සභාවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 18.85 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 54.15 ක්ද, වශයෙන් රු. මිලියන 73 ක් වෙන්කර දී තිබුණි. සභාව රු. මිලියන 74 ක ආදායමක් උපයාගෙන තිබුණද සභාවේ කාර්යයන් සඳහා රු. මිලියන 15 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් යෙදවීම අවම මට්ටමක පැවතුණි. | සභාවේ සාමාන්‍ය පරිපාලනය සඳහාත් මාර්ග අනතුරු අවම කිරීම සඳහාත් වන්දි ගෙවීම සඳහා අරමුදල් භාවිතා කරන බව. | සභාවේ අරමුණු ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් පරිදි මුදල් යෙදවීමට වගබලා ගත යුතු බව. |

**3.4 මානව සම්පත් කළමනාකරණය.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස කටයුතු කරන අතර මෙම සභාව ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් 11 ක ගෙන් හා කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවකුගෙන් සමන්විත විය. | ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම බවට පත්කිරීමෙන් අනතුරුව ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කරන බව. | සභාවේ කටයුතු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට පියවර ගත යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1** **තිරසර සංවර්ධන අරමුණු.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද ක්‍රියාත්මකවීම දුර්වල බව නිරීක්ෂණය විය. | කාර්යසාධනය මැනීම සඳහා දත්ත පද්ධතියක් ස්ථානගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | තිරසර සංවර්ධන අරමුණු සඳහා සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |